# බතේ උරුමය රැකීම

අපේ ජනතාවගේ කුසගිනි නිවීමට බතට පැවැරුන වගකීම සැහැල්ලු කරන්නට මෑත ඉතිහාසයේ ආධාර කරුවන් රාශියක් එක්වී සිටී බවට සාධක සුපතලයි. කුරක්කන්, අල, බතල, මෙනේරි, ඉරිඟු. මුං, තල ආදී එම ආධාර කරුවන්ට එද සමාජයේ බතට සමාන දේවත්වයක් හිමිවුනා. කුරක්කන් තලප කෑ බව එද ගැමියා කීවේ ආඩම්බරයෙන්. (මේ නිසාදෝ කුරක්කන් පැහැයට පැරණි රාජ්‍ය මන්ත්‍රණ සභාවට යැමටත් එද හැකි වුනා.) එහෙත් මේ තත්ත්වය දැන් ඉතා සීග්‍රයෙන් වෙනස් වී ඇති බව අපේ සංඛ්‍යා ලේඛන දක්වනවා. 1970 සිට 1981 දක්වා එකොළොස් වසරක කාල පරිච්ඡේදයක මෙම බෝග වගාව පිළිබඳව ලැබෙන සංඛ්‍යාලේඛන, පෙන්වා දෙන්නේ එම වගාවන්හි ප්‍රගතිය ඉතා බෙදනීය තත්ත්වයකට පත්වී ඇති බවක්. (1 සටහන බලන්න.)

ඉතිහාසයේ සිට ලක් වැසියාගේ ජීවිතයේ කොටසක්ව තිබුන මෙම වගාවන්ට මෙම ඉරණම අත්වූයේ කුමක් නිසාද? මෙයට සාර්ථක පිළිතුරක් ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පර්යේෂණ සංග්‍රහයක් ලබා දෙයි. ටී. ෂන්මුගම් මෙනෙවිය හා එස්. එම්. පී. සේනානායක මහතා විසින් පළකර ඇති ''ධාන්‍ය නිෂ්පාදනය ව්‍යාප්ත කිරීමේ හැකියාවන් නම් ග්‍රන්ථයෙන්.'' මෙරටට නිදහස ලැබීමෙන් පසු අපේ ආහාර නිෂ්පාදන වැඩ සටහන ක්‍රියාත්මක වූයේ. සහල් නිපදවීම වැඩි වැඩියෙන් සහල් නිපදවීම අරමුණු කරගෙනයි. වැඩි වැඩියෙන් වී වැපිරීමට කුඹුරු අස්වැද්දීම නිසා ධාන්‍ය වගාවට වෙන්වුන ඉඩකඩම් ප්‍රමාණය අඩු වුනා. අනතුරුව ආරම්භ වුන ආහාර වගා වැඩ පිළිවෙලක වැඩි අවධානය යොමුවුනේ, එවකට විශාල මුදලක් වැයවූ ලූනු මිරිස් හා අර්තාපල් වගාවන් වර්ධනය කිරීමට.

මේ අංශයේ වැදගත් පියවර වින්නේ ධාන්‍ය නිපදවන ගොවියාට සාධාරණ මිලක් ලබාගැනීමට ආධාර කරනු පිණිස රජය ඇරඹූ සහතික මිල ක්‍රමය. එහෙත් ඒ මිල ක්‍රමය හෝ කෘෂි පර්යේෂණ මගින් හඳුන්වා දුන් නව බෝග වර්ග, නව ගොවිතැන් ක්‍රම හෝ නිෂ්පාදනය වර්ධනය කිරීමට හේතු සාධක වී නෑ. නිෂ්පාදනය මේ පසු බැසීමට හේතු ලෙස පෙනී යන්නේ අපේ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා සපිරීම වෙනත් ආහාර භාරගෙන තිබීම. අපේ ජනතාවට අවශ්‍ය කැලරි ප්‍රමාණයෙන් තුනෙන් දෙකක්ම දැන් ලබා දෙන්නේ බත්. ඉරිඟු තුනෙන් එක සැපයීම විදේශවලින් මෙරටට ගෙනෙන තිරිඟු පිටි බාරගෙන. අනෙක් අතින් මයිසූර් පරිප්පු වැනි ආහාර සුලභවීමත් මෙයට බලපෑම් ඇති කරලා. මේ ප්‍රශ්නය විසඳීමට නම්, අපේ ජනප්‍රිය ආහාර රටාවලට අනුකූලව මෙම ධාන්‍ය සැකසිය යුතුයි. එමගෙහි පියවරක් වශයෙන්, ධාන්‍ය පිටි තිරිඟු පිටිවලට එක්කරමින්, නව පාන් වර්ගයක් නිපදවීමට ලංකා විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ආයතනය සාර්ථක පර්යේෂණයක් පවත්වා තිබෙනවා.

දශක ගණනාවක් තිස්සේ මෙරටේ අවශ්‍යතාවයක් තිබූ මෙම ධාන්‍ය නිෂ්පාදනයද ඇතුළත්ව අතිරේක බෝග වගා වර්ධනය කිරීමේ අරමුණින් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමති ගාමණී ජය

සටහන 1

## දිවයිනේ අතිරේක ආහාර

| | 69–70 | 70–71 | 71–72 | 72–73 | 73–74 |
|---|---|---|---|---|---|
| කව්පි | 10223 | 10121 | 13574 | 13194 | 14268 |
| බඩඉරිඟු | 47100 | 44014 | 49669 | 50171 | 83521 |
| මෙනේරි | 2788 | 2650 | 3133 | 4383 | 6684 |
| සෝගම් (ඉදල් ඉරිඟු) | 2338 | 1933 | 1930 | 3629 | 9043 |
| කුරක්කන් | 50828 | 52303 | 54540 | 74578 | 93882 |
| මුංඇට | 9429 | 9254 | 11206 | 17853 | 21714 |
| මඤ්ඤොක්කා | 146037 | 167332 | 146186 | 284106 | 393697 |
| බතල | 39151 | 36973 | 63376 | 66485 | 100793 |

මූලය – සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

# අතිරේක බෝග

සූරිය මහතාගේ මෙහෙයවීම අනුව ක්‍රියාත්මක වෙනවා. ලබන වසරේ ආරම්භවී 1988 දක්වා ක්‍රියාත්මක කෙරෙන මෙම වැඩ පිළිවෙල අනුව සියලුම අතිරේක බෝග වලින් අප රටට ස්වයංපෝෂිත විය හැකියි අදහස් කෙරෙනවා. වාර්ෂික ජනගහන වර්ධනය 1.7%ක් ලෙස ගතහොත් අපේ ජනප්‍රිය අතිරේක වර්ග වන අර්තාපල්, මිරිස්, රතු ලූනු හා මුංඇට ආදියෙහි සැලකිය යුතු ලෙස අවශ්‍යතාව වැඩිවෙලා (2 සටහන බලන්න.)

එම සටහන් අපේ ජනප්‍රිය අතිරේක භෝගවල අවශ්‍යතා හඬ ගා කියනවා. මේ හැරුනවිට, අනෙක් ආහාර ධාන්‍ය වර්ග වගා වර්ධනය කිරීමද මෙම සැළැස්මේ අරමුණක්. කුරක්කන්, බඩ ඉරිඟු, ඉදල් ඉරිඟු, කව්පි, රටකජු, සෝයා, මයියොක්කා, බතල, රතුලූනු, බොම්බයි ලූනු හා තල මෙම වර්ග වලට අයත් වෙනවා. මෙම කැලය තුළදී මෙම ආහාර වර්ග වගා කරන අක්කර ප්‍රමාණය දළ වශයෙන් අක්කර අට ලක්ෂයේ සිට එකොළොස් ලක්ෂය දක්වා ප්‍රමාණයක් වැඩි කෙරෙනවා. එහි අදහස අක්කර තුන් ලක්ෂයක් හෝ වසරකට අක්කර පනස් දහසක් වැඩිවන බවයි.

එහෙත් මෙබඳු වැඩ පිළිවෙලක සාර්ථකත්වය රඳා පවතින කරුණු රැසක් ඇතුළත්. ඒවා නම් මේ සඳහා අවශ්‍ය ඉඩම් සොයා ගැනීම, නව තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගැනීම, උසස් පැල හෝ බීජ්තර ව්‍යාබෝග ලබා දීම වැනි කරුණුයි.

මෙම ව්‍යාපාරයේ ව්‍යාප්ති කටයුතු සඳහා පමණක් වසරකට රු: 7,50,000 ක් වැය වේ යැයි ගණන් බලා තියෙනවා. කෙසේ වුවද, මෙය විශාල පරිමාණයේ ඒකාබද්ධ වැඩ පිළිවෙලක්. නව තාක්ෂණය, උචිත පර්යේෂණ, කෘෂි විධි ක්‍රම, උපයෝගී කර ගන්නා මෙම වැඩ පිළිවෙලේ අරමුණු මේ ආකාරයෙනුත් අපේ රට සංවර්ධනය වීමයි. එය සාර්ථක වුවහොත් අපේ රට බතින් බුලතින් පමණක් නොව අතිරේක භෝග වලිනුත් ස්වයංපෝෂිත වෙයි.

සටහන 2

## අතිරේක ආහාරබෝග අවශ්‍යතාවයන් (ටොන් වලින්)

| වර්ගය | 1948 | 1985 | 1986 | 1987 | 1988 |
|---|---|---|---|---|---|
| අර්තාපල් | 1720 | 1747 | 1777 | 1807 | 1836 |
| රතුලූණු | 2083 | 2118 | 2154 | 2191 | 2228 |
| වියලිමිරිස් | 576 | 586 | 596 | 606 | 616 |
| මුංඇට | 715 | 727 | 739 | 752 | 765 |

## වගාකළ භූමි ප්‍රමාණය

| 74–75 | 75–76 | 76–77 | 77–78 | 78–79 | 79–80 |
|---|---|---|---|---|---|
| 28340 | 28583 | 32138 | 29249 | 30778 | 49710 |
| 98094 | 94592 | 67875 | 61207 | 46163 | 48021 |
| 11201 | 10245 | 8045 | 6040 | 7998 | 6521 |
| 14352 | 8729 | 5432 | 5126 | 1026 | 1383 |
| 108247 | 97630 | 85504 | 71485 | 51084 | 91443 |
| 39277 | 29639 | 29277 | 29931 | 31729 | 33971 |
| 407160 | 273575 | – | 183656 | 132370 | 126042 |
| 119847 | 112548 | 68561 | 51102 | 40365 | 35351 |